කරෙයිනගර් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

ප්‍රාදේශීය සභා සවිබල ගැන්වීමේ වැඩ යෝජනා ක්‍රමය පරිදි, නිමකළ වැඩ පහක් වෙනුවෙන් කළ යුතු ගෙවීම් කොන්ත්‍රාත්කරුවන්ට සම්පූර්ණයෙන්ම ගෙන්වා තිබුණි. කෙසේවෙතත්, එකතුව රු.1,667,456 ක්වූ මුදලක් විවිධ ණය හිමි ගිණුමට ඇතුළත්ව තිබුණි. එනිසා විවිධ ණය හිමි ගිණුම් ශේෂය රු.1,667,456 කින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

ලැබිය යුතු ගිණුම්
-----------------------

(අ) එකතුව රු.1,021,132 ක්වූ වර්ග 4 ක යලි ඉදිකිරීම් කර්මාන්ත සඳහා සහා අරමුදලින් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට දෙන ලද අත්තිකාරම්වලට අදාළ කොන්ත්‍රාත්තු නිමකර තිබුණේ නමුත්, අත්තිකාරම් අයකර ගැනීම සඳහා පසුගිය මාස 06 සිට මාස 12 ක කාලය තුළ සභාව විසින් ක්‍රියාකර නොතිබුණි.

(ආ) එකතුව රුපියල් මිලියන 12.09 ක්වූ ප්‍රාදේශීය සභා සවිබල ගැන්වීමේ යෝජනා ක්‍රම පහකට අදාළව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක තුළදී වැඩ නිමකරනු ලැබ කොන්ත්‍රාත්කරුට සභා අරමුදලින් ගෙවීම්කර ඇතත්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මේ දක්වාම රුපියල් මිලියන 1.68ක මුදලක් ලැබීමට තිබිණි.

1.3.4 අනුකූල නොවීම්

--------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | -------------------------------- | ------------ | --------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 140(1) වගන්තිය | | පසුගිය වර්ෂ 28 සිට වර්ෂ 42 ක් වූ කාල පුරාම දේපළ 7800 ක් යලි තක්සේරු කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ආ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛ 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 | | චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය දෙනු ලැබූ නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,186,097 ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්ත වියදම ඉක්මවූ ආදායම රු.5,992,332 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ------------ | --------------- | ----------- | ------------- | --------------- | ------------- | ----------- | ----------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 10,000 | - | 6,750 | - | 20,000 | - | 7,900 | - |
| (ii) කුලී | 2,402,000 | - | 2,775,481 | - | 1,737,426 | - | 1,765,220 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 256,800 | - | 289,339 | - | 276,010 | - | 265,195 | - |
| (iv)වෙනත් ආදායම් | 9,504,260 | - | 13,522,672 | 16,505,725 | 9,810,870 | - | 9,622,454 | 9,650,363 |
| එකතුව | 12,173,060 | - | 16,594,242 | 16,505,725 | 11,835,300 | - | 11,660,769 | 9,650,363 |

(ආ) වරිපනම් හා බදු අය කිරීමේදී සභාව විසින් උපලේඛන නිකුත් කර නොමැති බව සහ ඇස්තමේන්තුගත ආදායම සහ රැස්කළ ආදායම අතර වෙනස මත සමුච්චිත හිඟ මුදල් පදනම්ව ඇති බැව් නිරීක්ෂණය විය.

2.2.2 කුලී මුදල්

-------

රු.9,000 ක්වූ බැකෝ වාහනයේ කුලී ගාස්තුව අයකර ගැනීම සඳහා පසුගිය දෙවසර තුළදී සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

-----------------

උතුරු පළාත් සභා ප්‍රධාන ලේකම් වෙතින් රු.4,249,095 ක්වූ මුද්දර ගාස්තු 2017 දෙසැම්බර් 31 දිනට දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

දෛනිකව රැස් කෙරෙන කසළ කැබලිකර පස්වලින් වසා දැමීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

--------------------------------

සුසාන භූමි 5 ක දේහ ආදාහනය සඳහා අනුමැතිය දීම සහ සුසාන භූමි බදු අයකිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

සභාව මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම විධිමත්ව සිදුකර නොමැති බැව් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 09 ක් විසින් නිමකළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---------------------------

3.4.1 වත්කම් භාරදීමට අසමත්වීම

---------------------------------

සභාව විසින් භාවිතා කරන වාහන තුනක් සභාවට අයත්ව නොතිබුණි.

3.4.2 අක්‍රිය වත්කම්

------------------

සභාවට අයත් වාහන හයක් අක්‍රියව පැවති අතර පසුගිය වසර 05 තිස්සේ එකී වාහන උපයෝගී කර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

-----------------------------------

අයවැය පාලනය

-------------------

අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.3,250 සිට රු.5,823,399 දක්වා හෙවත් සියයට 33 සිට සියයට 92 දක්වාත්, අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු. 3,171 සිට රු.5,232,910 දක්වා හෙවත් සියයට 01 සිට සියයට 23 දක්වා වූ පරාසවල විචලනය නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
|---|---|
| ගිණුම්කරණය | මිණුම් පත්‍රිකා උපලේඛනය සහ ඉඩම් විකුණුම් මත බදු ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |